WDR sinhala 2005

# ලෝක සංවර්ධන වාර්තාව - 2005

**වඩාත් ශීඝ්‍ර සංවර්ධනයටත්, දිළිඳු බව අවම කිරීමටත් යතුර නම්, ප්‍රතිපත්ති අවදානම, වියහියදම් සහ තරඟකාරීත්වයට තිබෙන බාධාවන් අඩු කිරීමයි.**

<u>වොෂිංටන්, සැප්තැම්බර් 28, 2004.</u>

සංවර්ධන වේගය අධික කරනු පිණිසත්, දිළිඳුකම අවම කිරීම පිණිසත්, ආණ්ඩු විසින් කළ යුතුව තිබෙන්නේ, සියලුම වර්ගවල සමාගම්වලට මුණපාන්නට වී තිබෙන ප්‍රතිපත්ති අවදානම, වියහියදම් සහ තරගකාරීත්වයට එළඹෙන බාධාත්, අඩු කිරීමය. ගොවීන් හා සුළු ව්‍යවසායකයන්ගේ පටන් දේශීය නිෂ්පාදන සමාගම් සහ බහු ජාතික සමාගම් දක්වා හැම සමාගම්වලටම මේවාට මූණපාන්නට සිදුවී ඇත්තේය. අද වොෂින්ටන්හි දී ප්‍රකාශයට පත් කරන ලද, 2005 වර්ෂය උදෙසා ලෝක බැංකුව විසින් ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තාවේ නිගමනය එයයි.

ලෝක බැංකුවේ ජ්‍යෙෂ්ඨ උප සභාපති සහ ප්‍රධාන ආර්ථික විද්‍යාඥ වූත්, ෆ්‍රැන්සුවා බෝර් ගී යොං, මේ වාර්තාව ඉදිරිපත් කරමින් ප්‍රකාශ කළේ මෙයයි. “සංවර්ධනය සඳහාත් දිළිඳුකම අවම කිරීම සඳහාත් ප්‍රධාන වශයෙන් අවශ්‍යවන්නේ යහපත් ආයෝජන වාතාවරණයකි. ක්‍රියාශීලී පෞද්ගලික අංශයත් රැකීරක්ෂා නිෂ්පාදනය කෙරේ. ජීවන මට්ටම උසස් කරනු සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් සම්පාදනය කෙරේ. එසේම, සෞඛ්‍ය, අධ්‍යාපන හා සෙසු සේවාවන් සඳහා අවශ්‍ය රජයේ ආයෝජනයන්ට උවමනා කරන අයබදූද ඒ අංශය විසින් ලබා දෙන්නේය. එහෙත්, ආණ්ඩු විසින් බොහෝවිට කරනු ලබන්නේ අසාධාරණ අවදානම්, වියහියදම් සහ තරගකාරීත්වයට බාධා පැමිණවීමත් මගින්, ඒ පෞද්ගලික අංශ විසින් රජයට සැපයෙන ධන ප්‍රමාණය අඩු කොට ලීමයි.”

“හැමෝටම යහපත් ආයෝජන වාතාවරණයක්” නම් වූ මේ වාර්තාව උදෙසා දත්ත ලබාගෙන තිබෙන්නේ, ඌන සංවර්ධිත රාජ්‍ය 53ක පිහිටි 30,000ක් පමණ වූ සමාගම් සංඛ්‍යාවක් පිළිබඳව කරන ලද සමීක්ෂණ වලිනුත්, “ව්‍යාපාර කරගෙන යෑම” නමැති ලෝක බංකුවේ දත්ත ගබඩාවෙනුත්, ඒ ඒ රටවල නිදර්ශන අධ්‍යයනය කිරීමෙනුත්, එමෙන්ම සෙසු අලුත් පර්යේෂණ වලිනුත්ය. නිෂ්පාදන ශක්තිය වැඩිවන ආකාරයෙනුත්, රැකීරක්ෂා සම්පාදනය කෙරෙන ආකාරයෙනුත් එමෙන්ම සිය කටයුතු ප්‍රසාරණය කළ හැකි වන ආකාරයෙනුත් ආයෝජනයෙහි යෙදිය හැකිවනු පිණිස, හැම වර්ගයේම සමාගම්වලට සැපයෙන අවස්ථා සහ දිරි දීමනා පෘථුල කිරීමෙන් සිය ආයෝජන වාතාවරණය දියුණු කොට ගන්නට ආණ්ඩු සතු අවස්ථා, ඒ වාර්තාව විසින් ඉස්මතු කොට දැක්වෙන්නේය.

ඌණ සංවර්ධිත රාජ්‍යයන්හි සමාගම් සතු ප්‍රශ්නවලින් ප්‍රධාන තැන ගන්නේ ප්‍රතිපත්ති හා ආශ්‍රිත අවදානමයි. මුල් තැන ගන්නා ප්‍රශ්නය වශයෙන් ගණන්ගෙන තිබෙන්නේ රජයේ ප්‍රතිපත්තිවල අන්තර්ගතය පිළිබඳව සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳවත් පවත්නා අස්ථිර භාවයයි. තවත් ප්‍රබල මට්ටමේ අවදානම් වශයෙන් නම් කෙරෙන්නේ මහා පරිමාණයේ ආර්ථික අස්ථාවරභාවයත්, සිතුමනාපයට පාලන නීති

ක්‍රියාවේ යෙදවීමත් එමෙන්ම දේ පොළ අයිතිය ආරක්ෂා කිරීම දුර්වල වීමත්ය. මේ අවදානම් නිසා වර්ධන අවස්ථා අඳුරුවේ. නිෂ්පාදන ශක්තිය වැඩිවන ආකාරයෙන් ආයෝජනයෙහි යෙදීමේ ක්‍රියාවලිය සහ රැකීරක්ෂා උපදවන්නට දිරිගැන්වීමේ ක්‍රියාවලියත් අකර්මන්‍ය වේ. ගෝතමාලාවේ වෙළඳ සමාගම්වලින් සීයට 90කට පමණත්, බෙලරූස් සහ සැම්බියා රාජ්‍යයන්හි වෙළඳ සමාගම්වලින් සීයට 70කට පමණත්, නීති-රීතිවල අරුත්කථනය අවිනිශ්චිත යැයි දැනෙන්නේය. බංග්ලාදේශ් රාජ්‍යයේ වෙළඳ සමාගම්වලින් සීයට 80කට අධික සංඛ්‍යාවක් තුළද, ඉක්වෙදෝර සහ මෝල්ඩෝවා රාජ්‍යයන්හි සීයට 70කට අධික වෙළඳ සමාගම් සංඛ්‍යාවක් තුළද, සිය දේපොළ අයිතිය තහවුරු කරනු පිණිස අධිකරණය කෙරෙහි විශ්වාසයක් නොමැත.

හුදෙක් ප්‍රතිපත්ති සිතුමනාපයේ වෙනස් නොවන්නේය යන විශ්වාසය දියුණු කිරීමෙන් පමණක්, නව ආයෝජන අධික කිරීමේ ප්‍රවනතාව සීයට 30කටත් අධික ප්‍රමාණයකින් වැඩිකළ හැකි යැයි, මේ වාර්තාව විසින් අවබෝධ කොටගෙන ඇත්තේය.

වෙළඳ සමාගම් මත පැටවෙන, ප්‍රතිපත්ති හා ආශ්‍රිත වියහියදම් ප්‍රමාණය ද විශාල විය හැක. ලද හැකි ආයෝජන අවස්ථා පවා ඒ නිසා, ලාභ සහිත නොවන්නේය. "2005හේ ව්‍යාපාර පවත්වාගෙන යෑම" නමැති ලෝක බැංකු වාර්තාව මේ මාසයේ මුල් භාගයේ දී ප්‍රකාශ කරන ලදී. යල්පැනගිය හෝ අක්‍රමවත් ලෙස සකස් කරන ලද හෝ නීති-රීති නිසා පැටවෙන විශාල බර, ඒ වාර්තාව විසින් ඉස්මතු කොට දැක්වූනේය. මේ නීති-රීති වඩාත් පෘථුල අර්බුදයක අංශයක් බව, "2005හේ ලෝක සංවර්ධන වාර්තාව" විසින් දැක්වෙන්නේය.

විශ්වාසය තැබිය නොහෙන විදුලිබල සම්පාදනය සහ සෙසු යටිතල පහසුකම් ද, අපරාධ සහ දූෂණ ද හේතුකොටගෙන පැටවෙන වියහියදම් ප්‍රමාණය, නීති-රීති නිසා ඇතිවන අධික වියහියදම් ප්‍රමාණය මෙන් දෙගුණයකටත් වඩා වැඩිය. ගිවිසුම් ක්‍රියාවේ යෙදවීමේ දුර්වලතාවයත්, බැරෑරුම් නීති-රීතිත් හා එක්වූ කල්හි මේ වියහියදම් ප්‍රමාණය අලෙවියෙන් සීයට 25කටත් වැඩිවිය හැකිය.

ඒ ප්‍රමාණය, වෙළඳ සමාගම් විසින් සාමාන්‍යයෙන් ගෙවනු ලබන අයබදු ප්‍රමාණය මෙන් තුන් ගුණයකට වැඩිය. එරිත්‍රියා, ඉන්දියා සහ කෙන්යා රාජ්‍යයන්හි විශ්වාසය තැබිය නොහෙන විදුලිබල සම්පාදනය හා ආශ්‍රිත වියහියදම් පමණක්, අලෙවියෙන් සීයට දහයකටත් වැඩිය. ඒ අතර ආර්මේනියා, අසර්බයිජාන් සහ පීරූ දේශයන්හි අපරාධ නිසා දරන්නට සිදුවන වියදම අලෙවියෙන් සීයට දහයකට වැඩිය. ඇල්ජීරියා, කාම්බෝජ සහ නිකරගුවා රාජ්‍යයන්හි අල්ලස් ප්‍රමාණය අලෙවියෙන් සීයට හයකටත් වැඩිය.

තරඟකාරීත්වයට ඇති බාධාත් ඉතා පෘථුලය. මේ හේතුකොටගෙන, නවීකරණයෙහි යෙදෙන්නටත්, සිය නිෂ්පාදන ශක්තිය දියුණු කොට ගන්නටත්, වෙළඳ සමාගම්වලට සැපයෙන දිරි ගැන්වීම් දුර්වල වේ. නවීකරණය සහ නිෂ්පාදන ශක්තිය දියුණුකොට ගැනීම, තිරසාර සංවර්ධනයේ යතුරයි. දැඩි අවදානම් සහ වියහියදම් විසින් තරඟකාරීත්වය සීමා කෙරේ. එසේම, වෙළඳපොළට අවතීර්ණවීම සඳහාත් ඉන් බැහැරවීම සඳහාත් ප්‍රතිපත්තිමය බාධා පැමිණවීමෙන් ආණ්ඩු විසින් ද තරඟකාරීත්වය සීමා කෙරෙයි. තරඟකාරීත්වයට විරෝධී චර්යාවන් සීමා කිරීමට වෙළඳ සමාගම් විසින් ප්‍රමාණවත් ප්‍රයත්නයක නොයෙදීම ද, තරඟකාරීත්වයට බාධාවකි.

පෝලන්තයේ සමාගම්වලින් සීයට 90ක් විසින් වාර්තා කෙරන්නේ ප්‍රබල තරඟකාරී වේගයකි. මෙය ජෝජියාවේ සමාගම් විසින් මූණපාන වේගය මෙන් දෙගුණයකටත් වැඩිය. එබාත් ප්‍රබල තරඟකාරී වේගය නිසා, නවීකාරක අවස්ථා සීයට පණහකටත් අධික ප්‍රමාණයකින් වැඩිවන බව මේ වාර්තාව විසින් අවබෝධ කොටගෙන ඇත්තේය.

අවදානම්, වියහියදම් සහ තරඟකාරීත්වයට පටහැනිවන බාධාත් පිළිබඳ ව්‍යුහය හා මට්ටම, හුදෙක් රටින් රටට පමණක් නොව, ඒ ඒ රටවල අභ්‍යන්තරයෙහිත්, ඉතා පෘථුල ලෙස වෙනස් වන්නේය. බ්‍රසීලයේ, චීනයේ සහ ඉන්දියාවේත් ප්‍රාන්තවලට සහ පළාත්වලට ද මේ ප්‍රකාශය ගැළපේ. එපමණක් නොවේ. කුඩා රටවල විවිධ ප්‍රදේශ අතරද මේ වෙනස් පවත්නේය. ආයෝජන වාතාවරණය දියුණු කිරීමෙහි ලා ජාතික ආණ්ඩු විසින් මෙන්ම ජාතියක කොටස්වල ආණ්ඩු විසින් ද වැදගත් මෙහෙයක් ඉටු කළ යුතුවේ.

දුබල ආයෝජන වාතාවරණ හේතුකොටගෙන කුඩා වෙළඳ සමාගම්වලට පහර වදින්නේය. ආර්ථිකයේ නිල නොවන පක්ෂයට අයත් සමාගම්වලට තදින්ම පහර වදින්නේය.

මේ වෙළඳ සමාගම්වලට මූල්‍ය සම්පත් ලබාගැනීම සහ රජයේ සේවා ලබාගැනීමත් අපහසු බවත්, එවැනි සමාගම් අධිකරණය කෙරේ තබන්නේ අඩු විශ්වාසයක් බවත් නීති-රීති වෙනස්වන ආකාරය ගැන ඒ සමාගම්වලට විශ්වාසය තැබිය නොහෙන බවත්, මේ වාර්තාව විසින් අවබෝධකොට ගෙන ඇත්තේය.

ස්වයං නිෂ්පාදිත විදුලිබලය සපයාගැනීමේ අවශ්‍යතාවය වැනි ස්ථාවර වියහියදම් නිසා පැනවෙන සීමා හේතුකොට ගෙන ද කුඩා වෙළඳ සමාගම් මත, එහි ප්‍රමාණයට නොගැළපෙන විදියේ බර පැටවේ.

## ප්‍රගතිය සඳහා විධිමත් ප්‍රතිපත්තිවලට වැඩි යමක් අවශ්‍ය වේ.

වාර්තාවේ ප්‍රධාන සංස්කාරක තැන්පත් වොරික් ස්මිත් මෙසේ පවසන්නේය:

ප්‍රතිපත්ති සහ ප්‍රායෝගික ක්‍රියාත් අතර පරතරයක් පවත්නා බව, වෙළඳ සමාගම්වලින් සීයට 90කටත් අධික සංඛ්‍යාවක් විසින් වාර්තා කෙරෙන්නේය. ඌන සංවර්ධිත රාජ්‍යයන් බොහොමයක නිෂ්පාදනයෙන් හරි අඩකටත් වැඩි ප්‍රමාණයක් සම්පාදනය කෙරෙන්නේ නිල නොවන ආර්ථික අංශයෙනි. ආණ්ඩු විසින් මේ පරතරය වැසිය යුතුවේ. ආයෝජන වාතාවරණය පිරිහීමට ලක් කළ හැකි අසාර්ථක ප්‍රතිපත්තිවලට හේතුවන ප්‍රබල කරුණුවලට මූණපාන්නටද ආණ්ඩු සූදානම් විය යුතුය.

ආයෝජන වාතාවරණය දියුණු කිරීමේ කටයුතුවලින් බොහොමයක් උදෙසා නීතියේ සහ දේශපාලනයේ වෙනස් කිරීම් අවශ්‍ය වේ. ඒ අතර, මේ වාර්තාව විසින් ඉස්මතුකොට දක්වනු ලබන්නේ සිය ආයෝජන වාතාවරණය දියුණු කරනු පිණිස ආණ්ඩු විසින් මූණ පෑ යුතු ප්‍රබල අභියෝග හතරකි.

- ❖ <u>දූෂණ සහ බදු සෙවීමේ සෙසු ක්‍රමත් සීමා කිරීම</u>. නිලධාරීන් හා සමඟ ගනුදෙනු කිරීමේදී අල්ලස් දිය යුතු බව, ඌන සවර්ධිත රාජ්‍යයන්හි සමාගම්වලින් බහුතරයක් විසින් ප්‍රකාශ කරනු ලැබේ. තවත් සමහර රාජ්‍යයන් විසින්, සිය

දේශයේ පවත්නා දූෂණ ඔවුන්ට මුණපාන්නට සිදුවන ප්‍රබලතම බාධාව වශයෙන් සඳහන් කෙරේ. දේශපාලන සම්බන්ධතා සහිත සමාගම් විසින් නොගැළපෙන ප්‍රමාණයෙන් බලය භාවිත කිරීම නිසා, ප්‍රතිපත්ති සහ ඒවා ක්‍රියාවේ යෙදවීමත් විකෘති වේ.

- ❖ **<u>රජයේ ප්‍රතිපත්තිවල විශ්වසනීයත්වය ගොඩ නැංවීම</u>**

සම්මත කොට ගනු ලබන අලුත් නීති, ස්ථාවර ලෙස ක්‍රියාවේ යෙදේ යැයි සාමාගම් විසින් විශ්වාස නොකෙරෙන කල්හි, අලුත් නීති සම්මත කොට ගැනීමෙන් එතරම් බලපෑමක් සිදු නොවේ.

- ❖ **<u>ප්‍රතිපත්ති දියුණු කොට ගැනීම සඳහා මහජන සහයෝගය සපයා ගැනීම</u>**

වඩාත් අධික නිෂ්පාදන ශක්තියක් සහිත සමාජයක් නිර්මාණය කිරීම සඳහා මහජන සහයෝගය ගොඩනංවාලීමට අසමත්වීම හේතුකොටගෙන, ප්‍රතිසංස්කරණවල වේගය අඩුවේ. ඒවායේ ස්ථාවරභාවය අන්තරායට ලත්වේ.

- ❖ **<u>ප්‍රතිපත්ති නිෂ්පාදනය, ඒ ඒ ප්‍රදේශයේ තත්ත්වයට ගැළපෙන සේ සකස් කොට ගැනීම</u>**

විවිධ ක්‍රියාදාමයන් සෙසු දේශවලින් අවිචාරී ලෙස ලබාගැනීම නිසා බොහෝවිට සිදුවන්නේ දුබල හෝ විකෘති වූ හෝ ප්‍රතිඵල හට ගැනීමයි.

- ❖ **<u>මූලික සේවා සම්පාදනය කෙරෙහි යොමු වීම</u>**

සියලුම සමාගම්වලටත්, සියලුම ක්‍රියාවලින්ටත් සෙත සැලසෙන පරිදි, යහපත් ආයෝජන වාතාවරණයක් පිළිබඳ ප්‍රාථමික පදනම් දියුණු කිරීම කෙරෙහි ආණ්ඩු යොමුවිය යුතුය. ප්‍රධාන ක්ෂේත්‍ර හතරක අත්දැකීම් කෙරෙන් උගෙන ගන්නා ලද පාඩම්, මේ වාර්තාව විසින් සමාලෝචනයට ලක් කෙරෙන්නේය.

- ❖ **<u>ස්ථාවරභාවය සහ සුරක්ෂිත බව</u>**

යහපත් ආයෝජන වාතාවරණයක් සඳහා සුරක්ෂිත දේපොළ අයිතිය මූලික අවශ්‍යතාවයකි. සිය අයිතිය සුරක්ෂිත යැයි විශ්වාස කළ පෝලන්ත, රුමේනියානු, රුසියානු, ස්ලොවේකියානු සහ යුක්රේන් සමාගම් විසින්, එසේ විශ්වාස නොකළ සමාගම් විසින් සිය ලාභයෙන් ප්‍රතිආයෝජනය කළ ප්‍රමාණයට වඩා සියට 14 සහ 20 අතර ප්‍රමාණයක වැඩි ලාභ කොටසක් ප්‍රතිආයෝජනය කරන ලදි. අයිතීන් වඩාත් සුරක්ෂිත කොටගත හැකිවන්නේ, ඉඩකඩම් සහ දේපොලවලටත් තිබෙන අයිතිය නිවරද ලෙස තහවුරු කොට ගැනීමෙනුත්, ගිවිසුම් ක්‍රියාවේ යෙදවීමේ ස්වභාවය දියුණුකොට ගැනීමෙනුත්, අපරාධ අඩු කිරීමෙනුත් එමෙන්ම ආණ්ඩු විසින් බලයෙන් ලබාගැනීම සීමා කිරීමෙනුත්ය.

## ❖ නීති-රීති සහ අයබදු

නීති-රීති සහ අයබදු විසින්, යහපත් ආයෝජන වාතාවරණයක් සඳහා වැදගත් මෙහෙයක් ඉටු කෙරෙන්නේය. එහෙත් බොහෝවිට ඒවානිසා අනවශ්‍ය අවදානම්, වියදම් සහ තරඟකාරීත්වයට බාධාත් පැමිණේ. ඒ හේතුකොටගෙන, නිල නොවන ආර්ථික පක්ෂය පෘථුල වෙයි. නීති-රීති ක්‍රියාත්මක කිරීමේ කටයුතු ක්‍රමවත් ලෙස හැඩගැස්වීම, සාර්ථක ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට අයත් එක් අංගයකි. උගන්ඩාව සහ වියට්නාමය එයට නිදර්ශනයි. කෙන්යාවේ සහ පීරු රාජ්‍යයේ මෙන් අයබදු පරිපාලන ක්‍රම දියුණු කිරීමත්, මොරොක්කෝවේ සහ ඝානාවේ මෙන් තීරුබදු ක්‍රම නවීකරණය කිරීමත් සාර්ථක ප්‍රතිසංස්කරණ අතර වෙති.

## ❖ මූල්‍ය සම්පාදනය සහ යටිතල පහසුකම්

බොහෝ ආයෝජන කාර්යයන්හිදී, මූල්‍ය සම්පාදනය සහ යටිතල පහසුකම්, අතිශයින්ම අවශ්‍ය සාධක වෙති. මේ සේවා සම්පාදනය කරන අය සඳහා ආයෝජන වාතාවරණය වඩාත් යහපත් කිරීම මඟින්, ආණ්ඩු වඩාත් හොඳ ප්‍රතිඵල ලබාගනිති. එහිදී ලැබෙන ලාභ, ආණ්ඩු විසින් සෘජුවම ඒ සේවා සම්පාදනයෙහි යෙදීමේදී ලැබෙන වාසිවලට වඩා හොඳය.

## ❖ ශ්‍රමදායකයන් සහ ශ්‍රම වෙළඳ පොළ

ජනයා යහපත් රැකියාවනට සම්බන්ධ කිරීමට, හොඳ ආයෝජන වාතාවරණයක් උපකාරී වන්නේය. ආණ්ඩු විසින්, කෞශල්‍යතා සහිත ශ්‍රම හමුදාවක් ගොඩනංවාලීම අවශ්‍යය. එසේම ශ්‍රම වෙළඳ පොළෙන් කෙරෙන ඉදිරිපත්වීම් ශ්‍රමදායකයන් සියලු දෙනාටම සෙත සලසන තැනට වගබලාගත යුතුත් වේ. (දැනට අව ප්‍රමාණයේ රැකියාවන්හි යෙදී සිටින අයත් නිල නොවන ආර්ථික ක්ෂේත්‍රයෙහි යෙදී සිටින ශ්‍රමදායකයනුත් මෙයට අයත්ය.) වඩාත් ක්‍රියාශීලී ආර්ථිකයක් තුළ සිදුවන වෙනසට ඔරොත්තු දී සිටිය හැකිවන පරිදි ආණ්ඩු විසින් ශ්‍රමිකයන්ට ආධාර කළ යුතුත් වෙයි.

මූලික දේවලින් ඈතට ගොස් සුවිශේෂී ප්‍රතිපත්තිමය වරප්‍රසාද ලබාදීම සඳහා ඇතැම් විශේෂ සමාගම් හෝ ක්‍රියාවලින් ඉලක්ක කොට ගැනීම, අන්තරාදායක ක්‍රමෝපායයකැයි මේ වාර්තාව අනතුරු ඇඟවීමක යෙදෙන්නේය.

<u>ලෝක බැංකු/ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ, පෞද්ගලික අංශ සංවර්ධනය පිළිබඳ උප සභාපති වූත්, ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ ප්‍රධාන ආර්ථික විශේෂඥයා වූත් මයිකල් ක්ලයින් මෙසේ පවසන්නේය.</u>

"සීමිත ආකාරයෙන් ඉදිරිපත්වීම පිළිබඳව, ආණ්ඩු, ශතවර්ෂ ගණනක් මුළුල්ලේම අත්හදා බැලීම් සිදුකොට ඇත්තේය. එහෙත්, ජාත්‍යන්තර අත්දැකීම්වලින් අනාවරණය වන ආකාරයට සර්වප්‍රකාරයෙන්ම සාර්ථක

ක්‍රමෝපායයක් නොමැත. එසේම, බොහෝ අවස්ථාවන්හිදී එවැනි ඉදිරිපත්වීම් ප්‍රබල ලෙස අසාර්ථක විය."

ප්‍රයත්න රැසකින් ලබන ලද අත්දැකීම්, මේ වාර්තා විසින් සමාලෝචනය කෙරේ. එවැනි ක්‍රමෝපායයන් හි අන්තර්ගත අවදානම අවම කොට ගත හැකි ක්‍රම පිළිබඳ උපදේශ මාලාද මේ වාර්තාව විසින් සැපයේ.

යතුර, අප්‍රතිහත ධෛර්යය මිස සර්වසම්පූර්ණ භාවය නොවේ.

චීනය, ඉන්දියාව, උගන්ඩාව වැනි රාජ්‍ය විසින් ලබන ලද සාර්ථකත්වය සඳහන් කරමින්, මේ වාර්තාව ඉස්මතු කොට දක්වන්නේ, හැම දෙයක් ම එකවර ඉටු කිරීම අවශ්‍ය නොවන බවයි. එසේ නැතිව, සමාගම්වලට මුහුණපාන්නට සිදුවන ප්‍රධාන බාධා නිරාකරණය කිරීමෙන් අගයැති ප්‍රගතියක් ලද හැකිවේ. එසේම අඛණ්ඩව කරගෙන යන, තිරසාර දියුණු කිරීම් පිළිබඳ ක්‍රියාදාමයක් මගින් ද, යහපත් ප්‍රගතියක් ලද හැකිවේ. දේපොළ අයිතිය දියුණු කිරීමෙන්, චීනය විසින් ආරම්භ කරන ලද ක්‍රියාදාමය නිසා කෝටි හතළිහක ජනකායක් දිළිඳුකමින් මුදාගත හැකිවිය. එහිදී මූලික ප්‍රතිසංස්කරණවලින් පසුව, ආයෝජන වාතාවරණය හා සම්බන්ධ අංශ බොහාමයකට අදාළවන පරිදි, අඛණ්ඩ දියුණු කිරීම් රැසක් ක්‍රියාවේ යොදවන ලදී.

ඒ ඒ රටවල සමාගම්වලට මුහුණපාන්නට සිදුවන ප්‍රධාන බාධා, රටින් රටට පෘථුල ලෙස වෙනස්විය හැකි වන හෙයින්, එමෙන්ම එකම කලාපයක වුවද එවැනි වෙනස්වීම් සිදුවිය හැකිවන හෙයිනුත්, ඒ එක එකට අයත් මුඛ්‍ය අවශ්‍යතා ඇගයීමට ලක් කළ යුතුවෙයි. ප්‍රතිසංස්කරණ වේගය නො අඩුව පවත්වාගෙන යනු පිණිස, සෙනගාල්, තුර්කිය සහ වියෙට්නාමය වැනි එකිනෙකට වෙනස් රටවල් විසින් ප්‍රතිඵලලාභීන් සහයෝගී කරගනු පිණිසත් බාධක සමාලෝචනය කරනු පිණිසත්, කැපවූ ආයතන පිහිටුවා ඇත්තේය. ප්‍රතිඵලදායී ජනතා සන්නිවේදන ක්‍රම විසින් ද ප්‍රගතිය තිරසාර ලෙස පවත්වාගෙන යෑම සඳහා ප්‍රබල මෙහෙයක් ඉටු කෙරෙන බව මේ වාර්තාව පවසන්නේය.

## <u>ජාත්‍යන්තර ජන කණ්ඩායම විසින් මීටත් වඩා ආධාර සම්පාදනය කළ යුතුය.</u>

යම්කිසි දේශයක ආයෝජන වාතාවරණය දියුණු කිරීම නිසා සිදුවන වර්ධනය සහ දිළිඳුකම අවම කිරීම, ජාත්‍යන්තර මට්ටමෙන් ලැබෙන ආධාර ප්‍රවාහයටත් වඩා වැඩිවිය හැකිය. සිය ආයෝජන වාතාවරණය දියුණුකොට ගන්නට, ඌන සංවර්ධිත රාජ්‍ය විසින් දැරෙන ප්‍රයත්නය ශක්තිමත් කරනු පිණිස පහත දැක්වෙන දේ ඉටු කරන්නැයි මේ වාර්තාව, ජාත්‍යන්තර ජන කණ්ඩායමෙන් ඉල්ලා සිටී.

- ඌන සංවර්ධිත රාජ්‍යයන්හි ආයෝජන වාතාවරණයට හානි සිදු කෙරෙන පරිදි සංවර්ධිත රාජ්‍යවල පවත්නා වෙළඳ ගනුදෙනු පිළිබඳ බාධාත්, සහනාධාර සහ වෙනත් අලෙවි විකෘතිත් ඉවත් කිරීම. සිය ආයෝජන වාතාවරණය දියුණු කොට ගැනීම සඳහා ඌන සංවර්ධිත රාජ්‍යයන්ට සැපයෙන ආධාර ප්‍රමාණය මෙන් හතර ගුණයකින් වැඩි සෙතක්, එවැනි දේ ඉවත් කිරීමෙන් මේ ඌන සංවර්ධිත රාජ්‍යයන්ට ලබාදිය හැකිවේ.

- සිය ආයෝජන වාතාවරණය දියුණුකොට ගැනීම සඳහා, ආණ්ඩුවලට උපකාරවනු පිණිස, වඩ වඩාත් ප්‍රතිඵලදායී ආධාර සම්පාදනය කිරීම. ප්‍රතිපත්ති දියුණුකොට ගැනීමේ සැලසුම් සහ ක්‍රියාත්මක කිරීම් පිළිබඳව සැපයෙන තාක්ෂණික හා ශිල්පීය ආධාර වෙසෙසින්ම වටනේ විය හැකිය. එහෙත් ඒ සඳහා දැනට සැපයෙන සම්පත් ප්‍රමාණය, ඒ ඒ සමාගම්වලට සහ ඒ ඒ ගනුදෙනුවලට යොමු කෙරෙන සම්පත් ප්‍රමාණයට වඩා අඩුය.

- ප්‍රතිපත්ති දියුණු කිරීමේ සැලසුම් සහ ක්‍රියාත්මක කිරීම් සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන්ට නව නවත් උපදේශ සපයනු පිණිස, ආයෝජන වාතාවරණය හා බද්ධ ප්‍රශ්න පිළිබඳව ලද හැකි ප්‍රබල දැනුම් සම්භාරය පිළිබඳ න්‍යාය පත්‍රය හරිහැටි ක්‍රියාකරවන්නට උපකාරිවීම.

---

තහංචි කාලය නිමාවන්නට පෙර, මාධ්‍යවේදීන්ට අවශ්‍ය කරුණු ලබාගත හැකිවන්නේ ලෝක බැංකුවේ මාධ්‍ය උපදේශක අන්තර්ජාල මධ්‍යස්ථානයට යොමු වීමෙනි. ඒ මෙසේය: http;//media.worldbank.org/secure/

තාමත් අවසරපදය නොලත් අනුමත මාධ්‍යවේදීන්ට, ඒ අවසරපදය ලබාගත හැක්කේ පහත දැක්වෙන ස්ථානයෙන් සැපයෙන ආකෘතිපත්‍රය සම්පූර්ණ කිරීමෙනි.
http://media.worldbank.org/

තහංචිය නිමාවූ හැටියේම වාර්තාව සහ ඒකාබද්ධ කරුණු මහජනයාට පහත දැක්වෙන ස්ථානයෙන් ලද හැකිය.
http://www.worldbank.org/wdr2005.

මේ වාර්තාව පිළිබඳව පළවන ප්‍රවෘත්තිවලදී ඒ ඉහත කී අන්තර්ජාල ලිපිනයන් ඇතුළු කරන ලෙස මාධ්‍ය ආයතනයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.